රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 354

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1986 දෙසැම්බර් මස 04 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය
සංස්ථා සභාපතිවරුන් වෙත.

1983 ජුලි මාසයේ ඇතිවූ කලබල නිසා දේපලවලට හානි සිදුවූ සහ/හෝ එවැනි දේපල අහිමිවූ රජයේ නිලධාරීන්ට හා රාජ්‍ය සංස්ථා සේවකයන්ට වැටුප් අත්තිකාරම් - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 237 ට සංශෝධන.

කරුණාකර අංක 237 හා 84.0.19 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 10 වැනි ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කරන්න.

"10. මෙම වැටුප් අත්තිකාරම ලබා ඇති නිලධරයකුගේ සේවය අවසන් කළහොත්, -ණය මුදලින් එතෙක් නොගෙවා ඇති ශේෂය (සමාන පොළියද සහිතව) එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන්/අප මුදලෙන්/පාරිතෝෂිකයෙන් හෝ නීත්‍යානුකූලව එවැනි අය කිරීමක් කළ හැකි, ඔහුට ගෙවිය යුතුව ඇති වෙනත් මුදල් වලින් හෝ අයකර ගැනීමට ගෙවීම් සහ ආයතන ඒකක වග බලා ගත යුතුය."

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.